රුහුණ විශ්වවිද්‍යාලය

**2016/2017** අධ්‍යයන වර්ෂය
ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි
දෙවන සමාසික අවසාන පරීක්ෂණය - **2018** ජුනි

**MAE 5203** – ලෝක ආර්ථික ප්‍රවණතා

ප්‍රශ්න හතරකට **(04)** පමණක් පිළිතුරු සපයන්න.
පැහැදිලි අත්අකුරින් පිළිතුරු සපයන්න.

කාලය : පැය **03** යි.

---

01. i. 'ව්‍යාපාර චක්‍ර' නමැති සංකල්පය නිර්වචනය කරන්න.

(ලකුණු 03)

ii. පහත වගුව අංක 01 හි සපයා ඇති තොරතුරු තුළින් අදාල දත්ත යොදාගනිමින් 1960 – 2015 කාල පරිච්ඡේදය සඳහා වන ව්‍යාපාර චක්‍ර වක්‍රය සහ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිත වක්‍රය එකම ප්‍රස්තාරයක ඇඳ පෙන්වන්න.

(ලකුණු 05)

වගු අංක **01**

ලෝක දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය සහ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය
(1960 – 2014 තෝරාගත් වර්ෂය)

| වර්ෂය | 1961 | 1964 | 1973 | 1975 | 1982 | 1988 | 1997 | 2006 | 2009 | 2015 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ද. දේ.නි. වර්ධනය % | 4.3 | 6.7 | 6.5 | 0.8 | 0.4 | 4.6 | 3.7 | 4.3 | -1.7 | 2.8 |
| ඒක පුද්ගල ද.දේ.නි. (US$) | 462 | 553 | 1172 | 1450 | 2470 | 3746 | 5346 | 7780 | 8784 | 10164 |

මූලය : World Bank Data (2016)

iii. 'පසුගිය අඩසියවසක කාලය පුරා පැතිර පැවති ගෝලීය ව්‍යාපාර චක්‍රයන්ගේ විවිධ අවධීන් විස්තර කළ හැකි මූලිකතම සාධකය වන්නේ බාහිර කම්පනයන් ය. (External Shocks)' සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

02. " වර්ෂ 1950 ගණන් හා සසඳන කල්හි පසුගිය දශක කිහිපය තුළ ලෝක වෙළඳාමේ රටාව ව්‍යුහ විපර්යාසයකට භාජනය වී ඇත." සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

03. i. 'හරිත වර්ණ ක්ෂේත්‍රීය විදේශීය සෘජු ආයෝජන සහ අඳුරු වර්ණ ක්ෂේත්‍රීය විදේශීය සෘජු ආයෝජන (Greenfield Foreign Direct Investments and Brownfield Foreign Direct Investment) අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. මෙම එක් එක් (Greenfield and Brownfield) විදේශීය සෘජු ආයෝජන ක්‍රමෝපායන්ගෙන් ආයෝජකයිනට සහ ඒවා ලබා ගන්නා රටට සමුච්ඡය වන වාසි සහ අවාසි විස්තර කරන්න.

(ලකුණු 05)

iii. ආසියානු කලාපයේ සිදුවන විදේශීය සෘජු ආයෝජන ප්‍රවාහයන්ගේ මෑත කාලීන ප්‍රවණතා කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

04. i. "ගෝලීය ත්‍රස්තවාදය" යන්නට පිළිගත හැකි නිර්වචනයක් සපයන්න.

(ලකුණු 05)

ii. ජාත්‍යන්තරව ත්‍රස්තවාදයක් ආරම්භ වීමට මූලිකවන හේතු, එවැන්නක් මගින් ලෝක ආර්ථිකයට මුදා හරිනු ලැබිය හැකි යැයි අපේක්ෂිත ආර්ථික ප්‍රතිවිපාක සහ එය නැවැත්වීමට ගතහැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න.

(ලකුණු 10)

05. i. "ජාත්‍යන්තර ද්‍රවශීලතා ප්‍රශ්න" යන්නෙන් ඔබට අදහස් වන්නේ කුමක් ද?

(ලකුණු 03)

ii. ජාත්‍යන්තර ද්‍රවශීලතා ප්‍රශ්නය විසඳීම අරභයා එය ආරම්භයේ සිට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අනුගමනය කරනු ලැබ ඇති විකල්ප ක්‍රමෝපායන් සහ ප්‍රතිපත්ති පිළිබඳව විවේචනාත්මක ඇගයීමක් කරන්න.

(ලකුණු 12)

06. ගෝලීය ආර්ථික වර්ධන ප්‍රවණතාවන් තුළින් මෑත කාලීනව පිළිබිඹු වන අත්දැකීම් අවධාරණය කරමින් "ගෝලීයකරණය ක්‍රියාවලියේ එක් ප්‍රමුඛතම ඵලයක් වන්නේ සම්ප්‍රදායික සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර ගෝලීයකරණයේ ජයග්‍රාහකයෝ සහ අසහනයෝ වශයෙන් ද්විත්වයක් වර්ධනය වෙමින් පැවතීමයි" යන මතය විවේචනය කරන්න.

(ලකුණු 15)

07. පහත සඳහන් ඕනෑම දෙකක් (02) පිළිබඳව සටහන් ලියන්න.

i. චීනයේ 'එක් වෙරළ තීරයක් - එක් මාවතක් ප්‍රාරම්භය (One Belt One Road Initiative (OBOR) in China)

ii. යුරෝපා සංගමය ශ්‍රී ලංකාවට උපකාර කරයි. (European Union (EU) Supports Sri Lanka)

iii. ස්වාභාවික සම්පත් කළමනාකරණය සහ චිරස්ථායි සංවර්ධනය (Natural Resource Management and Sustainable Development)

iv. ආර්ථික සහයෝගීතාව (හෝ ඒකීකරණය) Economic Integration

(එක් කොටසකට ලකුණු 08 බැගින් උපරිම ලකුණු 15)

@@@@@@@@@@@